# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර 03

# 3803 - අවධානම, පාලනයන් සහ විගණනය [RCA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## 3803 - අවධානම, පාලනයන් සහ විගණනය (RCA)
## නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) ඃ**

**දෙනු ලබන කාලයඃ**

- කියවීම සඳහා ඃ විනාඩි 15 යි.
- ලිවීම සඳහා ඃ පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- A කොටස, B කොටස සහ C කොටසේ සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු ඃ

| කොටස | ලකුණු |
|---|---|
| A | 20 |
| B | 30 |
| C | 50 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50 කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය සහ අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ.
- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.**

(මුළු ලකුණු 20)

**A කොටස**

**ප්‍රශ්න අංක 01**

**මිලේනියම් ටෙක් සමාගම** යනු වේගයෙන් වර්ධනය වන තාක්ෂණ සමාගමක් වන අතර, එය කොළඹ කොටස් වෙළඳපොළේ (CSE) ලැයිස්තුගත කිරීම සඳහා සූදානම් වෙමින් එහි සංයුක්ත පාලන පද්ධතිය (corporate governance system) ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංයුක්ත පාලනයේ ඕනෑම ප්‍රධාන සංරචක දෙකක් (02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(b) අවදානම් කළමනාකරණ කමිටුවේ කාර්යභාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

**ප්‍රශ්න අංක 02**

පුනර්ජනනීය බලශක්ති සමාගමක් වන **සීමාසහිත Greentech පොදු සමාගම**, ඇල්මැති පාර්ශවයන් සඳහා එහි පාරිසරික, සමාජීය සහ පාලන (ESG) වාර්තාව පිළියෙළ කරමින් සිටී. ESG තොරතුරුවල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා, **සීමාසහිත Greentech පොදු සමාගම** ස්වාධීන සහතික කිරීම සපයන්නෙකු සම්බන්ධ කර ගැනීමට සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**Greentech පොදු සමාගමෙහි** ESG වාර්තාවට අදාළව සහතික කිරීමේ කටයුතුවල ප්‍රධාන මූලිකාංග තුනක් (03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

**ප්‍රශ්න අංක 03**

**සීමාසහිත FreshCart (පෞද්ගලික) සමාගම** යනු වර්ධනය වන මාර්ගගත ක්‍රමය ඔස්සේ සිල්ලර බඩු බෙදාහරින සමාගමකි. පාරිභෝගිකයින් ජංගම දුරකථන යෙදුමක් හරහා තම ඇණවුම් සිදුකරන අතර, සමාගම එදිනම අදාල භාණ්ඩ බෙදා හැරීමට පොරොන්දු වේ. කෙසේවෙතත්, මෑත මාසවලදී, ගනුදෙනුකරුවන් තම බෙදාහැරීම්වල ප්‍රමාදයන් සහ වැරදි අයිතම බෙදාහැර ඇති බවට වාර්තා කර ඇත. ඇණවුම් හැසිරවීමේදී සම්බන්ධ විවිධ ව්‍යාපාරික කාර්යයන් අතර ගැටළු නිසා ගැටළු ඇති විය හැකි බව අභ්‍යන්තර සමාලෝචනයකින් සොයා ගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සමාගමේ මෙහෙයුම්වලට සම්බන්ධ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් දෙකක් (02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) මෙම ව්‍යාපාර ක්‍රියාවලීන් අන්තර් සම්බන්ධිත ලෙස අවබෝධ කර ගැනීමේ වැදගත්කම **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

**ප්‍රශ්න අංක 04**

**සීමාසහිත Eco Build (පෞද්ගලික) සමාගම** පරිසර හිතකාමී ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදකයෙකි. මෑතකදී පවත්වන ලද අභ්‍යන්තර සමාලෝචනයකින් හෙළි වූයේ, නිසි අනුමැතියකින් තොරව ගැනුම් ඇණවුම් ලබා දී ඇති බවත්, ලැබුණු භාණ්ඩ ඇණවුම් කළ දේට අනුකූලව සත්‍යාපනය කර නොමැති බවත්ය. මෙම ගැටළු හේතුවෙන් අධික ඇණවුම් කිරීම්, සැපයුම්කරුවන්ගේ ගෙවීම් ප්‍රමාද වීම සහ බෙදාහැරීම් පිළිබඳ ගැටළු ඇති වී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Eco Build (පෞද්ගලික) සමාගමේ** ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන උප ක්‍රියාවලීන් දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත Eco Build (පෞද්ගලික) සමාගමේ** ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු අභ්‍යන්තර පාලනයන් දෙකක් (02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

**A කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.**

(මුළු ලකුණු 30)

## B කොටස

**ප්‍රශ්න අංක 05**

**සීමාසහිත Agro පොදු සමාගම,** ප්‍රමුඛතම කෘෂිකාර්මික ව්‍යාපාරික සමාගමකි. වර්තමානයේ, සමාගම අර්ධ වශයෙන් ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධතියක් භාවිතා කරන අතර, මාසික මූල්‍ය ප්‍රකාශන වසා දැමීමේ ක්‍රියාවලිය අතරතුරදී, විශේෂයෙන් ගිණුම් ශේෂ සංසන්දනය කිරීමේදී හස්තමය ආකාරයට මැදිහත් වීම් අවශ්‍ය වේ.

මෑතකදී, අතුරු මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රමාදයක් සිදුවී ඇති අතර, එය, මූල්‍ය කණ්ඩායම තුළ ප්‍රමාණවත් සම්පත් නොමැති බව පිළිබඳ සැළකිලිමත් අවධානයක් ඇති කර ඇත.

මීට අමතරව, ප්‍රධාන මූල්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු සමාගම හැර ගොස් ඇති අතර, එමඟින් අභියෝග තවත් උග්‍ර වී තිබේ. මූල්‍ය වාර්තාකරණයේ සහ සමස්ත පාලනයේ නිරවද්‍යතාවය සහ කාලෝචිතභාවය කෙරෙහි මෙම ගැටළුවල බලපෑම පිළිබඳව විගණන කමිටුව දැන් සැලකිලිමත් වේ.

මෙම ගැටළු විසඳීම සඳහා, සමාගම ඩිජිටල් පරිවර්තන තාක්ෂණයන් ගවේෂණය කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Agro පොදු සමාගමෙහි** මූල්‍ය ප්‍රකාශන වසා දැමීමේ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකම් දෙකක් (02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) මූල්‍ය ප්‍රකාශව වසා දැමීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේදී විගණන කමිටුවේ කාර්යභාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) ස්වයංක්‍රීයකරණය, කෘතිම බුද්ධිය වැනි ඩිජිටල් පරිවර්තන තාක්ෂණයන් මූල්‍ය ප්‍රකාශන වසා දැමීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත කරන ආකාරය සහ **Agro පොදු සමාගමෙහි** පාලනය ශක්තිමත් කරන ආකාරය **සාකච්ඡා කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## ප්‍රශ්න අංක 06

**සීමාසහිත Stretch Apparels (පෞද්ගලික) සමාගම** යනු අපනයන වෙළඳපොළ සඳහා ඇඟලුම් නිෂ්පාදනය කරන ශ්‍රී ලාංකික සමාගමකි. එහි නිෂ්පාදිත බොහොමයක් එක්සත් ජනපදයට (ඇමරිකා එක්සත් ජනපදයට) සහ යුරෝපයට අපනයනය කෙරේ. සමාගමට ශ්‍රී ලංකාවේ පිහිටා ඇති කර්මාන්තශාලා කිහිපයක් ඇති අතර, සේවකයින් 2,000 කට අධික ශ්‍රම බලකායක් සිටී.

මෑතකදී, එක්සත් ජනපද රජය වෙනත් රටවලින් ආනයනය කරන ඇඳුම් සඳහා ඉහළ තීරු බද්දක් ප්‍රකාශයට පත් කළේය. පළමුව, ශ්‍රී ලංකාව 44% ක තීරුබද්දට මුහුණ දීමට තිබුණි. ඊට පසුව දින 90 ක විරාමයක් ලබා දුණි. මෙම කාලය තුළ, සියලුම රටවල් 10% ක තීරුබද්දක් පමණක් ගෙවයි. මෙය සමාගමට හැඩ ගැසීමට යම් කාලයක් ලබා දෙයි.

අභ්‍යන්තර විගණනයෙන් සමාගමේ ව්‍යාපාර ක්‍රියාවලීන්හි ගැටළු කිහිපයක් අනාවරණය විය, ඒවා අතර:

- පාරිභෝගික ඇණවුම් නිරීක්ෂණය කිරීමේ වැරදි.
- නිෂ්පාදනය අතරතුර සිදුවන රෙදි නාස්තිය.
- තෙවන පාර්ශවීය ප්‍රවාහන සැපයුම්කරුවන් විසින් සිදු කරන ලද බෙදාහැරීමේ ප්‍රමාදයන්.

කෘතීම බුද්ධිය මත පදනම් වූ පුරෝකථනය සහ වළාකුළු පදනම් ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ (Cloud Based ERP) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් සමාගම සිය මෙහෙයුම් නවීකරණය කිරීමට ද කටයුතු කරමින් සිටී. කෙසේ වෙතත්, එය මෑතකදී සේවක දත්ත සහ පිරිවැය දත්ත ඉලක්ක කරගත් තතුබෑම් ප්‍රහාරයකට (phishing Attack) මුහුණ දෙන ලදී.

සමාගම වඩාත් පරිසර හිතකාමී වීමට ප්‍රතිඥා දී ඇත. ජල පරිභෝජනය 30% කින් අඩු කර පරිසර හිතකාමී ඩයි වර්ග භාවිතා කිරීමට සැලසුම් කරයි. නමුත්, නව යන්ත්‍ර වැඩි විදුලියක් පරිභෝජනය කරන බැවින් මෙම ඉලක්ක සපුරා ගැනීම වඩාත් අපහසු කරයි. සමාගමේ පාරිසරික උත්සාහයන් පිළිබඳ ඇතැම් වාර්තා අසම්පූර්ණ සහ සාවද්‍ය බව ද විගණනයෙන් හෙළි විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධියෙන් උදාහරණ භාවිතා කරමින් සමාගම අවදානමට නිරාවරණය කරන සමාගමේ ව්‍යාපාර ක්‍රියාවලීන් දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ඩිජිටල් පරිවර්තනය සහ තිරසාර උත්සාහයන් හේතුවෙන් සමාගම මුහුණ දෙන නවීන ව්‍යාපාරික අවදානම් දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) ඉහත (b) හි හඳුනාගත් එක් එක් අවදානම් සඳහා ගන්නා පියවරක් **සාකච්ඡා කරන්න.**

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

## ප්‍රශ්න අංක 07

**සීමාසහිත T Zone (පෞද්ගලික) සමාගම** විසින් දිවයිනේ ප්‍රධාන නගරවල දෙපාර්තමේන්තු ගබඩා දාමයක් ක්‍රියාත්මක කරයි. සෑම වෙළඳසැලක්ම තමන්ගේ විකුණුම්, මුදල් එකතු කිරීම සහ තොග කළමනාකරණය හසුරුවයි. මෑතකදී, ප්‍රධාන කාර්යාලය දෝෂ අවම කිරීම සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා නව අභ්‍යන්තර පාලන කට්ටලයක් හඳුන්වා දුන්නේය. මේවාට ඇතුළත් වන්නේ:

- දවස අවසානයේ එකතු කරන සියලුම මුදල් ගණන් කර කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතුය.
- තොග ගණනය කිරීම් සතිපතා සිදු කළ යුතු අතර, ප්‍රතිඵල ප්‍රධාන කාර්යාලයට යැවිය යුතුය.
- යම් මුදලකට වඩා වැඩි ගනුදෙනුකරුවන්ට ලබා දෙන ඕනෑම වට්ටමක් ගබඩා කළමනාකරුවෙකු විසින් අනුමත කළ යුතුය.

මෙම පාලනයන් හොඳින් සැලසුම් කර තිබේද සහ ඒවා වෙළඳසැල්වල ක්‍රියාත්මක කරන්නේද යන්න සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කණ්ඩායම විමසා ඇත. වඩා හොඳ අභ්‍යන්තර පාලනයන් සහ නිතිපතා විගණනයන් ව්‍යාපාරයට අලාභ අඩු කිරීමට, වාර්තා කිරීමේ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීමට සහ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇතැයි කළමනාකරණය විශ්වාස කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත T Zone (පෞද්ගලික) සමාගමෙහි** මෙහෙයුම් සඵලදායී ලෙස කළමනාකරණය කිරීමට එහි අභ්‍යන්තර පාලනයන් සහ අභ්‍යන්තර විගණනයන් උපකාරී වන ආකාර තුනක් (03) **පැහැදිලි කරන්න.**

(ලකුණු 06)

(b) දෛනික මුදල් හැසිරවීමේ පාලනය සඵලදායී ලෙස සැලසුම් කර ඇත්දැයි පරීක්ෂා කිරීමට අභ්‍යන්තර විගණන කණ්ඩායමට භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම දෙකක් (02) **සාකච්ඡා කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**B කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.**

(මුළු ලකුණු 50)

**C කොටස**

**ප්‍රශ්න අංක 08**

**සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගම** ශ්‍රී ලංකාව පුරා අලෙවිසැල් 12 ක් ක්‍රියාත්මක කරන අලුතින් පිහිටුවන ලද සුපිරි වෙළඳසැල් ජාලයකි. සමාගම, සිල්ලර බඩු, ගෘහ භාණ්ඩ අයිතම සහ නැවුම් නිෂ්පාදන පිරිනමන අතර, දෛනික විකුණුම්, මුදල් සහ ඉලෙක්ට්‍රොනික ගෙවීම් හරහා සිදු කෙරේ. එහි පුළුල් කිරීමේ උපාය මාර්ගයේ කොටසක් ලෙස, සමාගම නව වෙළඳසැල් පහක් විවෘත කිරීමට සහ එහි ප්‍රවාහනය සහ සැපයුම් සේවා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සැලකිය යුතු බැංකු ණයක් අපේක්ෂා කරයි. මේ සඳහා 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම බැංකුවට අවශ්‍ය වේ.

මෙය සමාගමේ පළමු ව්‍යවස්ථාපිත විගණනය වන අතර, විගණනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් **PQR සහ සමාගම**, වරලත් ගණකාධිකාරීවරුන් පත් කර ඇත.

මූලික කාර්යභාර රැස්වීමේදී, විගණන හවුල්කරු පහත සඳහන් කරුණු සඳහන් කළේය:

- මූල්‍ය දෙපාර්තමේන්තුව කුඩා වන අතර, ප්‍රධාන ගිණුම්කරණ රාජකාරී සේවකයින් කිහිප දෙනෙකු අතර බෙදා ගැනේ. කාර්ය මණ්ඩලයට සීමිත විගණන අත්දැකීම් ඇත.

- 2024 නොවැම්බර් මාසයේදී නව විකුණුම් ලක්ෂ්‍යයක් (POS) සහ තොග කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදී. ඇතැම් අලෙවිසැල්වලට පද්ධතිය සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කිරීමට අපහසු වී තිබුණු අතර, භෞතික තොගය බොහෝ විට පද්ධතියේ වාර්තා සමඟ නොගැලපේ.

- සෑම වෙළඳසැලක්ම බොහෝ දුරට මුදල්, කාඩ්පත් සහ ජංගම මුදල් පසුම්බි හරහා දිනපතා ගනුදෙනු සිය ගණනක් හසුරුවයි. සමාගම සෑම අලෙවිසැලකම ස්වාධීන මුදල් සංසන්දන පාලනයන් භාවිතා නොකරයි.

- කළමනාකරණය විසින් තොග හැකිලීම සහ අඩු කිරීම, යල් පැන ගිය අයිතම සඳහා වෙන් කිරීම් සහ සැක සහිත වෙළඳ ලැබිය යුතු සඳහා ඇස්තමේන්තු කර ඇත. මෙම සංඛ්‍යා, වාර්තා කල ලාභයට සැලකිය යුතු ලෙස බලපෑ හැකිය.

- අලෙවිසැල් දෙකක තොග සොරකම් සහ වාර්තා නොකළ විකුණුම් පිළිබඳ වාර්තා තිබේ. කළමනාකරණය අභ්‍යන්තර සමාලෝචනයක් ආරම්භ කළද, එය තවමත් අවසන් කර හෝ ලේඛනගත කර නොමැත.

- බැංකුවේ ණය සැකසුම් කාලරාමුව සපුරාලීම සඳහා විගණනය සති හයක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය.

විගණන කණ්ඩායම දැන් සැලසුම් කිරීමේ අදියර සඳහා සූදානම් වෙමින් සිටින අතර, එයට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සහ අවදානම් තක්සේරු කිරීම ඇතුළත් වේ. කාර්යභාර හවුල්කරු අදාළ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuS) විගණනය පුරාවට අනුගමනය කරන ලෙස විගණන කණ්ඩායමට උපදෙස් දී ඇති අතර, නිසි ලියකියවිලි සහ වාර්තා කිරීම සහතික කරන ලෙස උපදෙස් දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගමෙහි** ස්වාධීන විගණකවරයාගේ වගකීම් තුනක් (03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගම** සමඟ විගණන සේවයේ යෙදවීමේ ලිපියේදී එකඟ විය යුතු අත්‍යවශ්‍ය මූලිකාංග දෙකක් (02) **විමසන්න.** (ලකුණු 04)

(c) විගණනය සැලසුම් කිරීමේ කොටසක් ලෙස (එනම්, සමස්ත උපාය මාර්ගය සහ සවිස්තරාත්මක විගණන සැලැස්ම පිළියෙළ කිරීමේදී) **සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගමෙහි** විගණකවරුන් අනුගමනය කළ යුතු ප්‍රධාන පියවර තුනක් (03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(d) **සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගමේ** විගණනය සඳහා ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේදී විගණන කාර්යාභාර කණ්ඩායම සලකා බැලිය යුතු සාධක දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(e) විගණනය අතරතුර වංචා අවදානම හඳුනාගෙන ප්‍රතිචාර දැක්වීම සඳහා විගණකගේ වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(f) **සීමාසහිත Fresh Mart (පෞද්ගලික) සමාගම** සහ එහි පරිසරය තේරුම් ගැනීමට විගණන කණ්ඩායම භාවිතා කළ හැකි ක්‍රියාපටිපාටි දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක 09**

**සීමාසහිත Med Care (පුද්ගලික) සමාගම (සමාගම)** ශ්‍රී ලංකාව පුරා පෞද්ගලික රෝහල් සහ විශේෂඥ වෛද්‍ය මධ්‍යස්ථාන දාමයක් ක්‍රියාත්මක කරයි. සමාගම සාමාන්‍ය සහ ශල්‍ය සත්කාර, රසායනාගාර පරීක්ෂණ සහ බාහිර රෝගී සේවා සපයයි. පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ, සමාගම රෝහල් හයක් දක්වා ව්‍යාප්ත වී ඇති අතර 2026 මුල් භාගය වන විට තවත් රෝහල් දෙකක් විවෘත කිරීමට සැලසුම් කරයි.

ශ්‍රී ලංකාවේ නව පුද්ගලික දත්ත ආරක්ෂණ නීතියක් හඳුන්වාදීමත් සමඟ, මෑත කාලීන කර්මාන්ත අවදානම් සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කර තිබේ. වර්තමානයේ, අවදානම් කළමනාකරණය අවිධිමත් ලෙස දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කරනු ලබන අතර, සමාගමේ උපායමාර්ගික සැලසුම්කරණය හෝ පාලන ක්‍රියාවලියට ඒකාබද්ධ නොවේ.

විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යයක් ස්ථාපිත කරන්නේද යන්න සලකා බලමින් සිටී. ඇතැම් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් විශ්වාස කරන්නේ, විශේෂයෙන් සායනික මෙහෙයුම් සහ ප්‍රසම්පාදනය තුළ එය අධීක්ෂණය ශක්තිමත් කරනු ඇති බවයි. කෙසේ වෙතත්, ප්‍රධාන විධායක නිලධාරියා විශ්වාස කරන්නේ දෙපාර්තමේන්තු පරීක්ෂාවන් ප්‍රමාණවත් බවත්, අභ්‍යන්තර විගණනය අනවශ්‍ය වියදමක් වනු ඇති බවත්ය.

මේ අතර, සමාගම, **අශෝක සහ සමාගම,** වරලත් ගණකාධිකාරීවරුන් ඔවුන්ගේ බාහිර විගණක ලෙස නැවත පත් කර ඇත. සැලසුම් අවධියේදී, විගණන හවුල්කරු පහත සඳහන් ගැටළු හඳුනාගෙන ඇත:

- සමාගමේ කාර්යභාර හවුල්කරු අඛණ්ඩව වසර හතක් මෙම භූමිකාව දරා ඇති අතර ඔහු ප්‍රධාන මූල්‍ය නිලධාරියා (CFO) සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන ඇති අතර, ඔහු මීට පෙර **අශෝක සහ සමාගමේ** සේවය කළ පුද්ගලයෙකු වේ.

- විගණනය සැලසුම් අවධියේදී සහාය වීම වෙනුවෙන් සමාගමේ මානව සම්පත් දෙපාර්තමේන්තුවෙන් "ස්තුතියි අභිනයෙන්" ලෙස ලබා දුන් තෑගී වවුචරයක් එක් කනිෂ්ඨ විගණන කණ්ඩායමේ සාමාජිකයෙකු පිළිගත්තේය.

- විගණන ආයතනය ඉහළ කාර්යමණ්ඩල පිරිවැටුමක් අත්විඳ ඇති අතර, එය කාර්යභාරයන්ගේ ගුණාත්මක සමාලෝචනයන්ට සහ අඛණ්ඩතාවයට බලපායි.

වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයට සහ තත්ත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූලව කාර්යභාරය පුරා කටයුතු කිරීමට හවුල්කරු කණ්ඩායමට උපදෙස් ලබා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Med Care (පෞද්ගලික) සමාගමෙහි** ව්‍යාපාර ක්‍රියාවලීන්ට, ව්‍යාපාර අවදානම් කළමනාකරණය (ERM) ඒකාබද්ධ කිරීමෙන් එහි මෙහෙයුම් වැඩිදියුණු කළ හැකි ක්‍රම තුනක් (03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත Med Care (පෞද්ගලික) සමාගමෙහි** මෙහෙයුම්, උපායමාර්ගික සැලසුම්කරණය හෝ පාලනයට ව්‍යාපාර අවදානම් කළමනාකරණය (ERM) ඇතුළත් කිරීමේ ප්‍රතිලාභ දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) අභ්‍යන්තර විගණන කාර්යයක් හඳුන්වා දෙන්නේ නම් **සීමාසහිත Med Care (පෞද්ගලික) සමාගමට** අනුගමනය කළ හැකි අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(d) **සීමාසහිත Med Care (පෞද්ගලික) සමාගමට** අභ්‍යන්තර විගණන කාර්යයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය විය හැකි හේතු දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) **සීමාසහිත Med Care (පෞද්ගලික) සමාගම** විගණනයේදී හමුවූ ආචාර්ය ධර්මවලට එල්ල විය හැකි තර්ජන දෙකක් (02) විගණනයට එහි ඇති බලපෑම සමඟ **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(f) ඉහත (e) කොටසේ හඳුනාගෙන ඇති තර්ජන අඩු කිරීමට හෝ ඉවත් කිරීමට විගණන ආයතනයට ක්‍රියාත්මක කළ හැකි ආරක්ෂක පියවර දෙකක් (02) **නිර්දේශ කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 25)

**C කොටසෙහි අවසානය**

## කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **මතක තබා ගැනීම**<br><br>කරුණු,පද,මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න. | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න. | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| **අවබෝධය**<br><br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ඨිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිපතව ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **භාවිතය**<br><br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ. | භාවිත කරන්න. | යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම. | ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම. |
| | ගණනය කරන්න. | ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම. | විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම. |
| | තීරණය කරන්න | පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම. | ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම. |
| | ප්‍රදර්ශනය කරන්න. | ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම. | ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම. |
| | පිළියෙල කරන්න. | භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම. | කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම. |
| | භාවිත කරන්න | සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම. | අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම. |
| | ඉදිරිපත් කරන්න. | සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම. | මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම. |
| **විශ්ලේෂණය**<br><br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම | විශ්ලේෂණය කරන්න. | සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම. | වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම. |
| | සසඳන්න | සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම. | ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම. | යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම. |
| | පරීක්ෂා කරන්න | යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම. | යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. | ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දළ විශ්ලේෂණයක් ලබා දීම. |
| | ක්‍රියා කරන්න | අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම. | කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම. |
| | වාර්තා කරන්න | සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම. | විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම. |

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **අගය කරන්න**<br><br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| **නිර්මාණය කිරීම**<br><br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කාණුකූල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

## අදියර 03

# 3803 - අවධානම, පාලනයන් සහ විගණනය [RCA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි

**අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.**

(මුළු ලකුණු 20)

**A කොටස**

**01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 01** | - | **පාලනමය ආකෘතිමය රාමුව** |
| ඉගෙනුම් ඵලය | - | ආයතනික පාලනයේ මූලිකාංග සහ කමිටු පිළිබඳ පැහැදිලි කිරීම. |
| | - | සඵලදායී අවදානම් කළමනාකරණය සඳහා ආයතනික පාලනයේ කාර්යභාරය පැහැදිලි කිරීම. |

(a) **සංයුක්ත පාලනයේ සංරචක:**

- අධ්‍යක්ෂ මණ්ඩලය.
- ඇල්මැති පාර්ශවයන්ගේ සහභාගීත්වය.
- විනිවිදභාවය සහ හෙළිදරව් කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධති.
- සදාචාරාත්මක ආයතනික සංස්කෘතිය.
- වගවීම. **(ලකුණු 1 බැගින්, ලකුණු 02)**

(b) **අවදානම් කළමනාකරණ කමිටුව:**

අවදානම් කළමනාකරණ කමිටුව ව්‍යාපාරයට බලපෑම් කළ හැකි අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ නිරීක්ෂණය කරයි. මෙම අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කරන අතර අවදානම් තක්සේරු සමාලෝචනය කිරීමෙන් සමාගම පිළිගත හැකි අවදානම් මට්ටම් තුළ ක්‍රියාත්මක වන බව සහතික කරයි. එසේම අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් රුචිය සහ පාලන ව්‍යුහය සම්බන්ධයෙන් එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. මෙය වත්කම් ආරක්ෂා කිරීමට, මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහ දිගුකාලීන තිරසාරභාවය වැඩි දියුණු කිරීමට උපකාරී වේ. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 05)**

**02 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 04** | - | **සහතික වීමේ කාර්යභාරය සහ සම්බන්ධිත සේවා** |
| ඉගෙනුම් ඵලය | - | සහතික වීමේ කාර්යභාරයක ප්‍රධාන සංරචක පැහැදිලි කිරීම සහ සංරචක සම්බන්ධ කිරීම. |

**සීමාසහිත Greentech පොදු සමාගමෙහි** ESG වාර්තාවට අයත් සන්දර්භය තුළ සහතික කිරීමේ කාර්යභාරයක ප්‍රධාන මූලිකාංග වන්නේ:

- **පාර්ශව තුනක සම්බන්ධතාවය:** සහතික කිරීමේ පරිචයකරු (ස්වාධීන විගණක), වගකිවයුතු පාර්ශවය (ESG වාර්තාව සකස් කරමින් සිටින **Greentech** හි කළමනාකරණය) සහ අපේක්ෂිත පරිශීලකයින් (ESG තොරතුරු මත විශ්වාසය තබන ඇල්මැති පාර්ශවයන්).
- **විෂය කරුණ:** වාර්තාවේ අඩංගු ESG දත්ත සහ හෙළිදරව් කිරීම්.
- **සුදුසු නිර්ණායක:** GRI ප්‍රමිති හෝ SLFRS S1 වැනි ESG දත්ත තක්සේරු කරන ප්‍රමිතීන් හෝ රාමු.
- **සාක්ෂිය:** නිගමනවලට සහාය වීම සඳහා පරීක්ෂාවන් සහ ඇගයීම හරහා සහතිකවීම සපයන්නන් විසින් රැස් කරන ලද තොරතුරු.
- **සහතික වීමේ වාර්තාව:** ඇල්මැති පාර්ශවයන්ගේ විශ්වාසය වැඩි දියුණු කරමින් ESG වාර්තාවේ විශ්වසනීයත්වය සඳහන් කරමින් සහතිකවීම සපයන්නා විසින් ලබා දෙන නිගමනය. **(ලකුණු 02 බැගින්, ලකුණු 05)**

**03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 02** | - | **ව්‍යාපාර සංවිධානවල ව්‍යාපාර ක්‍රියාවලීන්** |
| ඉගෙනුම් ඵලය | - | සංවිධානයක් යනු එකිනෙකට සම්බන්ධිත ක්‍රියාවලීන් පද්ධතියක් ලෙස අවබෝධ කර ගනිමින් ව්‍යාපාර ක්‍රියාවලිය හඳුනා ගැනීම සහ වැදගත්කම පැහැදිලි කිරීම. |

**(a) ව්‍යාපාර ක්‍රියාවලීන්:**

- ඇණවුම් කළමනාකරණය - පාරිභෝගික ඇණවුම් ලබා ගැනීම සහ සැකසීම.
- තොග කළමනාකරණය - අයිතමය ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සහ නිකුත් කිරීම සඳහා අයිතම සකස් කිරීම.
- බෙදා හැරීමේ ක්‍රියාවලිය.
- මුදල් කළමනාකරණය.
- ප්‍රසම්පාදන කළමනාකරණය. **(ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(b) අන්තර් සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලීන්හි වැදගත්කම:**

- මෙම ක්‍රියාවලීන් සමීපව සම්බන්ධ වේ. ඇණවුම් කළමනාකරණය වැරදි හෝ ප්‍රමාද වූ ඇණවුම් විස්තර යවන්නේ නම්, තොග කණ්ඩායම වැරදි අයිතම ඇසුරුම් කිරීම හෝ තොග ගැටළුවලට මුහුණ දිය හැකිය.
- මෙය බෙදා හැරීමේ ක්‍රියාවලියට බලපාන අතර, ප්‍රමාදයන් හෝ දෝෂ ඇති කරයි.
- අන්තර් සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම දෙපාර්තමේන්තු හරහා සම්බන්ධීකරණය සහතික කිරීමට, දෝෂ අඩු කිරීමට සහ පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීමට උපකාරී වේ. **(ලකුණු 01½ බැගින් ලකුණු 03)**

**(මුළු ලකුණු 05)**

**04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 02** | - | **ව්‍යාපාර සංවිධානවල ව්‍යාපාර ක්‍රියාවලීන්** |
| ඉගෙනුම් ඵලය | - | ව්‍යාපාර සංවිධානවල ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන් (ප්‍රසම්පාදන ක්‍රියාවලිය, වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය, මුදල් කලමනාකරණය කිරීමේ ක්‍රියාවලිය, තොග කලමනාකරණ ක්‍රියාවලිය, දේපළ පිරියත හා උපකරණ ක්‍රියාවලිය) විමසීම. |

**(a) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන උප ක්‍රියාවලීන්:**

- **ගැනුම් අධියාචනාව (Purchase Requisition)** - භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තුවක් විසින් ඉල්ලීමක් කරනු ලැබේ.
- **ඇණවුම් කිරීමේ ක්‍රියාවලිය (Ordering process)** - ප්‍රසම්පාදන කණ්ඩායම ගැනුම් ඇනවුමක් ජනනය කරයි, එය සැපයුම්කරුවන්ට යැවීමට පෙර අනුමත කළ යුතුය.
- **භාණ්ඩ ලැබීම (Receipt of goods)** - භාණ්ඩ ලැබුණු විට, ඒවා තොග ලෙස පිළිගැනීමට පෙර ලැබුණු අයිතම නිවැරදි ප්‍රමාණයන් සහ නිවැරදි අයිතමයන්ගෙන් ලැබී ඇති බවට තහවුරු කර ගැනීම් සඳහා ගැනුම් ඇනවුමට සහ භාණ්ඩ භාර දීමේ තුණ්ඩුවට එරෙහිව පරීක්ෂා කරනු ලැබේ. **(එකකට ලකුණු 01½, ලකුණු 03)**

**(b) පාලනයන්:**

- ගැනුම් ඇණවුම් අනුමත කිරීම සඳහා පාලනය.
- ගැනුම් ඉල්ලීම් අනුමැතිය.
- ගෙවීම් කිරීමට පෙර ත්‍රිත්ව-මාර්ග ගැලපීම.
- ලබා දී ඇති ගැනුම් ඇණවුමට අනුව භාණ්ඩ ලැබීම සත්‍යාපනය කිරීමෙන් පසු, නම් කරන ලද නිලධාරියෙකු විසින් භාණ්ඩ ලැබීම් පත්‍ර (GRN) අනුමත කිරීම.

**(ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(මුළු ලකුණු 05)**

**A කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.**

(මුළු ලකුණු 30)

**B කොටස**

**05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 02** | - | **ව්‍යාපාර සංවිධානවල ව්‍යාපාර ක්‍රියාවලීන්** |
| ඉගෙනුම් ඵලය | - | සම්බන්ධිත පාර්ශව සමග ගණුදෙනු සහ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව තීරණාත්මක පාලන ක්‍රියාවලීන් හඳුනාගෙන ආයතනයේ අනුකූලතාවයන්ට, විනිවිදභාවයන්ට සහ වගවීම සහතික කිරීමේදී ඒවායේ කාර්යභාරය අවධාරණය කරමින් විමසීම. |
| | - | ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රශස්ථ කිරීමේදී ඩිජිටල් තාක්ෂණයේ (ස්වයංක්‍රීයගත කිරීම, කෘතිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනීම ඇතුළුව) කාර්යභාරය පැහැදිලි කිරීම. |

**(a) මූල්‍ය ප්‍රකාශන වසා දැමීමේ ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකම්:**

- සැසඳුම් ක්‍රියාවලිය හරහා දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සත්‍යාපනය කිරීම.
- ගැලපුම් ජර්නල් සටහන් ඇතුලත් කිරීම (අවසන් සටහන්) - ජර්නල් සටහන් ගැලපීම.
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සමාලෝචනය කිරීම.

**(ලකුණු 01 බැගින්, ලකුණු 02)**

**(b) විගණන කමිටුවේ කාර්යභාරය:**

- කාලෝචිත සහ නිවැරදි මූල්‍ය වාර්තාකරණය සහතික කිරීම සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- මූල්‍ය කණ්ඩායම තුළ සම්පත් සහ නිපුණතා ප්‍රමාණවත් බව අධීක්ෂණය කිරීම, අඩුපාඩු හඳුනාගෙන තිබේ නම් කළමනාකරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ඇතැම් විට ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය හෝ පුහුණුවට සහාය වීමෙන්, අභ්‍යන්තර පාලනයන් සඵලදායීව පවතින බවත් කාර්ය මණ්ඩල පිරිවැටුමට අදාළ අවදානම් අවම කරන බවත් සහතික කිරීම. මූල්‍ය වාර්තාකරණය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් තිබේද යන්න ද එය තක්සේරු කරයි. **(ලකුණු 01½ බැගින්, ලකුණු 03)**

**(c) ඩිජිටල් පරිවර්තනය:**

- සැසඳුම් සහ වාර්තා ජනනය කිරීම විධිමත් කිරීම මගින් හස්ත ක්‍රමයට කාර්යභාරය සහ ප්‍රධාන කාර්ය මණ්ඩලය මත යැපීම අඩු කිරීම.
- විෂමතා හඳුනා ගැනීම සහ දත්ත අඛණ්ඩතාව සහතික කිරීම, විශේෂයෙන් කෘතිම බුද්ධිය (AI) භාවිතා කරන විට අඩු වූ මිනිස් බලය සඳහා වන්දි ලබාදෙන ඇඟවීම් සැපයීම.
- අවහිරයන් පුරෝකථනය කිරීමට සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීමට රටා විශ්ලේෂණය කිරීම මගින් වසා දැමීමේ වේගය සහ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම.
- උසස් ඒකාබද්ධ මෙවලම් හෝ ව්‍යාපාර සම්පත් සැලසුම් (ERP) පද්ධති භාවිතා කිරීමෙන් හස්ත ක්‍රමයට සංසන්දනය කිරීමේ අවශ්‍යතා අවම කර ගැනීමට සහ බාධාවකින් තොරව දත්ත ප්‍රවාහය සහතික කිරීමටත්, දෝෂ අඩු කරමින් සහ මූල්‍ය වාර්තාවල කාලෝචිතභාවය වැඩි දියුණු කිරීමටත් හැකිය.
- රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA) වැනි තාක්ෂණයන් භාවිතා කරන්නේ නම් එදිනෙදා කාර්යයන් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස හැසිරවිය හැකි අතර එමඟින් එදිනෙදා කාර්යයන් සඳහා අවශ්‍ය මිනිස් පැය ගණන අඩු කරයි.

**(ලකුණු 02½ බැගින්, ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

**06 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 02** | - | **ව්‍යාපාර සංවිධානවල ව්‍යාපාර ක්‍රියාවලීන්** |
| **ඒකකය 03** | - | **අවදානම් කළමනාකරණ ආකෘති රාමුව සහ අභ්‍යන්තර පාලන පද්ධතිය** |
| ඉගෙනුම් ඵලය | - | සංවිධානයක් යනු එකිනෙකට සම්බන්ධිත ක්‍රියාවලීන් පද්ධතියක් ලෙස අවබෝධ කර ගනිමින් ව්‍යාපාර ක්‍රියාවලිය හඳුනා ගැනීම සහ වැදගත්කම පැහැදිලි කිරීම. |
| | - | ඩිජිටල් පරිවර්තනය හා තිරසාරභාවයට අදාල නූතන ව්‍යාපාර අවදානම පැහැදිලි කිරීම. |
| | - | ව්‍යාපාර ක්‍රියාවලීන් සහ අවධානමට අනාවරණ වීම අතර සම්බන්ධතාව හඳුනා දැක්වීම. |

**(a) අවදානම් වලට නිරාවරණය වන ව්‍යාපාර ක්‍රියාවලීන්:**

- **ඇණවුම් හඹා යාමේ ක්‍රියාවලිය:** පාරිභෝගික ඇණවුම් හඹා යාමේ වැරදි අනවශ්‍ය ප්‍රමාදයන් හෝ වැරදි නැව්ගත කිරීම්වලට හේතු විය හැක. මෙය පාරිභෝගික තෘප්තියට බලපාන අතර අපනයන වෙළඳපොළවල ගැනුම්කරුවන් අහිමි වීමේ සහ අනාගත ඇණවුම් අහිමි වීමේ අවදානමක් ඇති කරයි.

- **නිෂ්පාදන ක්‍රියාවලියː රෙදි භාවිතයː** නිෂ්පාදනය අතරතුර රෙදි නාස්ති කිරීම ද්‍රව්‍ය පිරිවැය වැඩි කරයි. විශේෂයෙන් වත්මන් තීරුබදු විරාමය වැනි අවිනිශ්චිත මිලකරණ තත්වයන් තුළ එය ලාභදායීතාවයට අවදානමක් ද පෙන්නුම් කරයි.

- **බෙදා හැරීම සහ ප්‍රවාහන සහ සැපයුම් සේවා ක්‍රියාවලියː** තෙවන පාර්ශවීය ප්‍රවාහනය කරන්නන්ගේ ප්‍රමාද වූ බෙදාහැරීම් හේතුවෙන් එකඟ වූ දින නියමයන් මඟ හැරීම සහ දණ්ඩනවලට හේතු විය හැක. මෙය සමාගම කීර්තිනාම සහ ගිවිසුම් අවදානම්වලට නිරාවරණය කරයි.

**(එකකට ලකුණු 02 බැගින්, උපරිම ලකුණු 04)**

**(b) නවීන අවදානම්ː**

- **ඩිජිටල් අවදානම** - සයිබර් ආරක්ෂණ උල්ලංඝනයː සේවක දත්ත සහ පිරිවැය දත්ත වලට බලපෑම් කළ තතුබෑම් ප්‍රහාරයක් (phishing Attack). මෙය සංවේදී තොරතුරු අවදානමට ලක් කරන අතර මූල්‍ය හෝ නීතිමය ගැටළු ඇති කළ හැකිය.

- **තිරසාරභාවය පිලිබඳ අවදානම** - බලශක්ති භාවිතය එදිරිව පාරිසරික ඉලක්කː සමාගමට ජල පරිභෝජනය අඩු කිරීමට සහ පරිසර හිතකාමී වීමට අවශ්‍ය නමුත් නව යන්ත්‍ර වැඩි විදුලියක් භාවිතා කරයි. මෙය සමාගමට තම තිරසාර ඉලක්ක කරා ළඟා වීම වළක්වා ගත හැකි අතර, ගනුදෙනුකරුවන් අතෘප්තිමත් කළ හැකිය.

**(ලකුණු 01½ බැගින්, ලකුණු 03)**

**(c) පියවරයන් - නවීන අවදානම්**

| අවදානම | පාලනය |
|---|---|
| **ඩිජිටල් අවදානම** | • ද්වි-සාධක සත්‍යාපනය (Two - factor Authentication) හඳුන්වා දීම සහ සේවකයින් සඳහා නිතිපතා සයිබර් ආරක්ෂණ පුහුණුවක් පැවැත්වීම. තතුබෑම් සිදුවීමේදී වැළැක්වීම සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා නිතිපතා පද්ධති විගණන ක්‍රියාත්මක කිරීම.<br>ද්වි-සාධක සත්‍යාපනය මුරපදයක් තැබීමෙන් ඔබ්බට අමතර ආරක්ෂිත තට්ටුවක් එක් කරයි, පරිශීලක හැඳුනුම් සහතික සොරකම් කළත් අනවසර ප්‍රවේශය වඩාත් දුෂ්කර කරයි. සේවක පුහුණුව තුලින් තතුබෑම් වැනි සයිබර් තර්ජන පිළිබඳ දැනුවත්භාවය වැඩි කරන අතර ඩිජිටල් භාවිතයන් ප්‍රවර්ධනය කරයි, එමඟින් සාර්ථක සයිබර් ප්‍රහාරවල සම්භාවිතාව අඩු කරයි.<br>• සේවකයින් ගත යුතු අවදානම් සහ පියවර පිළිබඳ වඩාත් දැනුවත් වීම. |

| | |
|---|---|
| **තිරසාරභාවය පිලිබඳ අවදානම** | • නිවැරදි සහ කාලෝචිත දත්ත ලබා දීම සඳහා බලශක්ති අධීක්ෂණ පද්ධති ස්ථාපනය කර තිරසාරභාවය වාර්තා කිරීමේ ක්‍රියාවලීන් යාවත්කාලීන කිරීම.<br><br>බලශක්ති අධීක්ෂණ පද්ධති සැබෑ විදුලි පරිභෝජනය නිරීක්ෂණය කිරීමට උපකාරී වන අතර, අකාර්යක්ෂමතා හඳුනා ගැනීම සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම පහසු කරයි. නිවැරදි දත්ත මගින් තිරසාරභාවය පිළිබඳ වාර්තා සැබෑ කාර්යසාධනය පිළිබිඹු කරන බව සහතික කරන අතර නොමඟ යවන හිමිකම් පෑමේ අවදානම අඩු කරන අතර, ඇල්මැති පාර්ශවයන් සමඟ විශ්වසනීයත්වය පවත්වා ගැනීමට සමාගමට උපකාරී වේ.<br><br>• පරිසරයට අඩු හානියක් සිදු කරන හරිත ශක්තිය වැනි විකල්ප ශක්තීන් භාවිතා කිරීම සලකා බැලීම. |

**(එක් එක් අවදානම යටතේ එක් පියවරයක් සඳහා, ලකුණු 1½ බැගින්, මුළු ලකුණු 03 ක් දක්වා)**

**(මුළු ලකුණු 10)**

**07 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 03** | - | **අවදානම් කළමනාකරණ ආකෘති රාමුව සහ අභ්‍යන්තර පාලන පද්ධතිය** |
| ඉගෙනුම් ඵලය | - | අවධානම්, අභ්‍යන්තර පාලනයන් සහ විගණනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කිරීම. |
| | - | පාලනයන්හි සැළසුම් කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීමට භාවිතා කරන ශිල්පීය ක්‍රම විමසීම. |

**(a)**

- අභ්‍යන්තර පාලනයන් යනු අවදානම් සහ දෝෂ අඩු කිරීම සහ වංචා වැළැක්වීම මගින් සමාගමකට තම මෙහෙයුම් නිසි ලෙස පවත්වාගෙන යාමට උපකාරී වන ක්‍රියාපටිපාටි වේ. මෙම සමාගම සම්බන්ධයෙන්, දවස අවසානයේ සේවකයින් දෙදෙනෙකු විසින් මුදල් ගණන් කර අත්සන් කිරීම වැනි පාලනයන් ස්ථාපිත කිරීම මුදල් හැසිරවීමේ නිරවද්‍යතාවය සහතික කිරීමට සහ සොරකම් කිරීමේ හෝ අයුතු ලෙස අත්පත් කරගැනීම වැනි අවදානම් අවම කිරීමට උපකාරී වේ.

- සතිපතා තොග ගණනය කිරීම් කිසියම් වෙනස්කම් හෝ අතුරුදහන් වූ තොග හඳුනා ගැනීමට උපකාරී වන අතර, එය තොගයේ නිරවද්‍යතාවය වැඩි දියුණු කරන අතර සොරකම් කිරීම හෝ දුර්වල ලෙස හැසිරවීම හේතුවෙන් සිදුවන පාඩු වළක්වා ගැනීමට උපකාරී වේ.

- අභ්‍යන්තර විගණනයන් මෙම පාලනයන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා සමාගමට උපකාරී වේ. වෙළඳසැල් නව ක්‍රියාපටිපාටි අනුගමනය කරන්නේ දැයි විගණන කණ්ඩායමට සමාලෝචනය කළ හැකි අතර තවදුරටත් වැඩිදියුණු කිරීම් නිර්දේශ කළ හැකිය.

- අභ්‍යන්තර පාලනයන් සහ අභ්‍යන්තර විගණනයන් එක්ව නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම, වැරදි / දෝෂ අඩු කිරීම සහ සියලුම වෙළඳසැල් පාලනයන් අනුගමනය කරන බව සහතික කිරීම මගින් සමාගමට එහි මෙහෙයුම් සඵලදායී ලෙස කළමනාකරණය කිරීමට උපකාරී වේ. දැනුවත් ව්‍යාපාරික තීරණ ගැනීමට කළමනාකරණයට උපකාරී වේ. එදිනෙදා විගණනයන් මගින් වගවීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, කාර්යමණ්ඩලය අතර වගකීම සහ මෙහෙයුම් ප්‍රතිපත්තිවලට අනුකූල වීමට උපකාරී වේ.

**(එකකට ලකුණු 02 බැගින්, උපරිම ලකුණු 05)**

**(b) මෙහෙයුම් සඵලදායිතාව පරීක්ෂා කිරීම සඳහා ශිල්පීය ක්‍රම:**

**(i)** **විමසීම:** ක්‍රියාවලිය තේරුම් ගෙන ඇති බව තහවුරු කර ගැනීම සඳහා සේවකයින්ගෙන් මුදල් ගණනය කිරීම සිදු කරන ආකාරය පිළිබඳව විමසීම් කල හැකිය. තවද, සේවකයින් දැනුවත්ද යන්න සහ පාලන ක්‍රියාපටිපාටි යොදා ගන්නේද යන්න ඔවුන්ට තේරුම් ගත හැකිය.

**(ii)** **පරීක්ෂාව:** සත්‍යාපනය කිරීම සඳහා මුදල් ගණන් කිරීමේ පත්‍රිකා සේවකයින් දෙදෙනෙකු විසින් දිනපතා අත්සන් කර තිබේදැයි පරීක්ෂා කිරීම. තවද විගණන කණ්ඩායමට සැසඳුම් වාර්තා සහ බැංකු තැන්පතු පත්‍රිකා වැනි ලේඛන පරීක්ෂා කළ හැකිය. ද්විත්ව පාලනයන් තිබේද යන්න සලකා බැලීම සඳහා ගණනය කිරීම් නිරවද්‍යතාවය සහ වාර්තා කර ඇති මුදල් බැංකුවට තැන්පත් කර ඇති මුදල් සමග ගැලපෙනවාද යන්න ඔවුන්ට පරීක්ෂා කළ හැකිය.

**(iii)** **ඔස්සේ යාම:** පාලනය සැබවින්ම අනුගමනය කරන්නේ දැයි බැලීමට දින අවසානයේ මුදල් ගණන් කිරීමේ ක්‍රියාවලිය භෞතිකව නිරීක්ෂණය කරන්න. කාර්යමණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් අවශ්‍ය පරිදි මුදල් ගණන් කර අත්සන් කරන්නේද යන්න විගණකවරයාට නැරඹිය හැකිය. **(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

**B කොටසෙහි අවසානය**

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

**C කොටස**

**08 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | | |
|---|---|---|
| **ඒකකය 05** | **-** | **අවධානම් තක්සේරුව, විගණන ක්‍රියාවලිය සහ විගණන වාර්තාකරණය** |
| ඉගෙනුම් ඵලය | - | ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අනුව විගණනය සිදු කිරීම සහ විගණන කාර්යභාරයක නියමයන්ට එකග වීම පැහැදිලි කිරීම (SLAUS 200 & SLAUS 210). |
| | - | මූල්‍ය ප්‍රකාශන විගණනය සැළසුම් කිරීම පැහැදිලි කිරීම. (SLUS 300). |
| | - | සැදැහුම් ස්ථාපිත කිරීමේදී විගණනය සාක්ෂි ලබා ගැනීමට භාවිතා කරන ක්‍රියාපටිපාටි විමසීම(SLAUS 500) |
| | - | විගණන ප්‍රමාණාත්මකභාවය සහ විගණන ලේඛනගත කිරීම පැහැදිලි කිරීම(SLAUS 320 & SLAUS 230). |
| | - | වංචා අවදානම නිර්වචනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී වංචා වැලැක්වීම සහ අනාවරණ කිරීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම පැහැදිලි කිරීම (SLAUS 240). |

**(a) විගණකවරයාගේ වගකීම්:**

- **සාධාරණ සහතිකයක් ලබා ගැනීම** - 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **Fresh Mart** හි මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස වංචාවකින් හෝ වැරැද්දකින් සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනවලින් තොර බවට විගණකවරයා සාධාරණ සහතිකයක් ලබා ගත යුතුය. විශේෂයෙන් **Fresh Mart** හි රැස් කරන ලද මූලික තොරතුරු අනුව, වංචා අවදානම් සහ විය හැකි පාලන අඩුපාඩු / පාලනයන් නොමැතිකම හේතුවෙන් ඇති විය හැකි අවප්‍රකාශන ආමන්ත්‍රණය කිරීම සඳහා විගණනය හොඳින් සැලසුම් කර ඇති බවත් නිර්මාණය කර ඇති බවත් සහතික කළ යුතුය.
- **මතයක් ප්‍රකාශ කිරීම** - ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට (කුඩා සහ මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS for SMEs හෝ සම්පූර්ණ SLFRS වලට අදාළ වන පරිදි) අනුකූලව සකස් කර තිබේද යන්න පිළිබඳව විගණකවරයා මතයක් ප්‍රකාශ කළ යුතුය.
- **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAuS) සමඟ අනුකූල වීම** - ස්වාධීනත්වය සහ වෘත්තීය සංශය දෘෂ්ඨිය වැනි ආචාර ධර්ම අවශ්‍යතා ඇතුළුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuS) අනුකූලව විගණකවරයා විගණනය සිදු කළ යුතුය.

- **අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම** - විගණකවරයා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනවල අවදානම් තක්සේරු කළ යුතුය. **Fresh Marts** හි, අවදානම් අතරට සාවද්‍ය තොග, වාර්තා නොකළ විකුණුම් සහ කළමනාකරණ ඇස්තමේන්තු ඇතුළත් වේ.

- **සුදුසු පරිදි වාර්තා කිරීම** - විගණකවරයා මතය සහ විගණන ක්‍රියාවලියේදී සොයාගත් ඕනෑම ගැටළුවක් සන්නිවේදනය කරමින් ලිඛිත විගණන වාර්තාවක් නිකුත් කළ යුතුය.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 06)**

**(b)** **සේවය යෙදවීමේ ලිපිය:**

- විගණනයේ අරමුණ සහ විෂයපථය - මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණන මතයක් ලබා දීම අරමුණ බව ලිපියේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

- විගණකගේ වගකීම් - විගණන සාක්ෂි රැස් කිරීම සහ පසුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් සකස් කිරීම පිළිබඳව. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAuS) වලට අනුකූලව විගණනය සිදු කිරීමට සහ සාධාරණ සහතිකයක් ලබා ගැනීමට විගණකවරයා වගකිව යුතු බව එයින් ඉස්මතු කළ යුතුය.

- කළමනාකාරීත්වයේ වගකීම් - වාර්තා වෙත ප්‍රවේශය සැපයීම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, වංචා වැළැක්වීමේ සහ අනාවරණය කිරීමේ වගකීම සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අදාළ පාලනයන් ක්‍රියාත්මක කිරීම ඇතුළුව කළමනාකරණයේ වගකීම්.

- අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව - කළමනාකරණ වගකීම වන්නේ අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ විගණකවරයා විසින් අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේද යන්න පිළිබඳව මතයකට එළඹීමයි.

- විගණක විසින් නිකුත් කළ යුතු කිසියම් වාර්තාවක අපේක්ෂිත ආකෘතිය සහ අන්තර්ගතය සඳහා යොමුව - මූල්‍ය ප්‍රකාශන විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වන බවට යොමු කිරීමක්.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(c)**

- සේවාලාභියාගේ ව්‍යාපාරය සහ පරිසරය, කර්මාන්තය, විශේෂයෙන් මෙය අලුතින් ස්ථාපිත බැවින් තරඟය, ක්‍රියාත්මක වන උපායමාර්ග ආදිය අවබෝධ කර ගැනීම.

- අවබෝධය මත පදනම්ව පැන නගින අවදානම් හඳුනා ගැනීම, විශේෂයෙන් මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු අවප්‍රකාශනවලට තුඩු දෙන සැලකිය යුතු අවදානම්. උදා: මෙම අවස්ථාවේ දී සුදුසු පාලනයන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වංචා අවදානම ඉහළ යාම පිළිබඳ දර්ශක කිහිපයක් තිබේ.

- ව්‍යාපාර අවබෝධය සහ මූල්‍ය කාර්යසාධනය මත පදනම්ව විෂය පථය තීරණය කිරීම සඳහා ප්‍රමාණාත්මක මට්ටම් තීරණය කිරීම (ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සාධක)
- සුදුසු කාර්යමණ්ඩලය පැවරීම. නව පද්ධතියක් ක්‍රියාත්මක කර තිබෙන බැවින් තොරතුරු තාක්ෂණ විශේෂඥයෙකු හෝ වෙනත් ඕනෑම විශේෂඥයෙකු යොදා ගැනීමට අවශ්‍යද යන්න.
- විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය ඇතුළුව විගණන සැලැස්ම සංවර්ධනය කිරීම. **(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 05)**

**(d) ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීම:**

- **ව්‍යාපාරයේ ප්‍රමාණය සහ ස්වභාවය: Fresh Mart** යනු ඉහළ ගනුදෙනු පරිමාවක් සහ සාපේක්ෂව අඩු ආන්තිකයක් සහිත සිල්ලර සමාගමකි. මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට කුමන මට්ටමේ අවප්‍රකාශනයක් ප්‍රමාණාත්මකද යන්න තීරණය කිරීම සඳහා මුළු ආදායම, දළ ලාභය හෝ ශුද්ධ ලාභය වැනි පොදු මිණුම් සලකුණු ඇගයීමට ලක් කළ යුතුය.
- **නිශ්චිත ක්ෂේත්‍රවල අවප්‍රකාශනයේ අවදානම (ගුණාත්මක සාධක):** තොග හැකිලීම සහ කළමනාකරණ ඇස්තමේන්තු වැනි ඉහළ ආවේනික අවදානමක් ඇති ක්ෂේත්‍ර කණ්ඩායම විසින් සලකා බැලිය යුතුය. ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රවල කුඩා සාවද්‍ය ප්‍රකාශන පවා (උදා: වංචාවට ගොදුරු විය හැකි මුදලට විකුණුම් හෝ වාර්තා නොකළ ආදායම) තීරණ ගැනීමේදී ඒවායේ බලපෑම හේතුවෙන් ප්‍රමාණාත්මක විය හැකිය.
- **Fresh Mart** තවමත් මෙහෙයුම්වල පළමු වසරේ සිටින බැවින්, තක්සේරු කළ යුතු මිණුම් ලකුණෙහි යෝග්‍යතාවය උදා: සමාගමේ පළමු වසරේ කාර්යසාධනය මත පදනම්ව ලාභය සුදුසු මිණුම් ලකුණක් ලෙස යොදා ගත හැකිද යන්න.

**(එකකට ලකුණු 1½ බැගින්, ලකුණු 03)**

**(e)**

- මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත් කළ වංචාවකින් හෝ වැරැද්දකින් ඇති වූ අවප්‍රකාශනවලින් තොර බවට සාධාරණ සහතිකයක් ලබා ගැනීම. විශේෂයෙන් සොරකම් සහ වාර්තා නොකළ විකුණුම් පිළිබඳ වාර්තා සලකා බලමින්, වංචා අවදානම ආමන්ත්‍රණය කිරීම සඳහා විගණකවරයා නිශ්චිත ක්‍රියාපටිපාටි (උදා: අතිරික්ත මුදල් ගණන් කිරීම්, සංසන්දනය කිරීම්) සිදු කළ යුතුය.
- වෘත්තීය සංශය දෘෂ්ඨිය පවත්වා ගැනීම, අවදානම් තක්සේරුව සිදු කිරීම සහ හඳුනාගත් වංචා අවදානම් වලට ප්‍රතිචාර දැක්වීම සහ විගණන කාර්යභාරය පුරා වංචා අවදානම පිළිබඳ දර්ශක පිළිබඳව දැනුවත් කිරීම සඳහා විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම.

**(ලකුණු 03)**

**(f)** ක්‍රියාපටිපාටි:

- **අභ්‍යන්තර ලේඛන සමාලෝචනය කිරීම** - මූල්‍ය ප්‍රකාශන, ප්‍රතිපත්ති, සංවිධානාත්මක ව්‍යුහය වැනි අභ්‍යන්තර පාලන ලේඛන විශ්ලේෂණය කරන්න.
- **නිරීක්ෂණය කරන ලද මෙහෙයුම්** - සමහර අලෙවිසැල් වෙත ගොස් මුදල් එකතු කිරීම, තොග හැසිරවීම සහ ඔවුන් නව POS පද්ධතිය භාවිතා කරන ආකාරය නිරීක්ෂණය කරන්න.
- **කළමනාකරණයෙන් සහ කාර්ය මණ්ඩලයෙන් විමසීම්** - POS පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සොරකම පිළිබඳ අභ්‍යන්තර සමාලෝචන සහ ඇස්තමේන්තු කළ ආකාරය පිළිබඳව විමසන්න.
- **විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි** - අලෙවිසැල් හරහා සිදු කළ විකුණුම් හෝ දළ ආන්තික ප්‍රවණතා සංසන්දනය කරන්න, විශේෂයෙන් වාර්තා නොකළ විකුණුම් හෝ තොග හැකිලීම සැක සහිත බැවින්.
- වෙළඳපල තත්ත්වය, නියාමන අවශ්‍යතා, කර්මාන්තයට බලපාන ආර්ථික සාධක තේරුම් ගැනීමට කර්මාන්ත විශ්ලේෂණය සිදු කරන්න. **(එකකට ලකුණු 02 බැගින් ලකුණු 04)**

**(මුළු ලකුණු 25)**

**09 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**ඒකකය 06 - ව්‍යවසාය අවධානම් කළමනාකරණයේ මූලිකයන් (ERM)**

**ඒකකය 07 - අභ්‍යන්තර විගණනයේ මූලිකයන්**

**ඒකකය 08 - මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන අචාරධර්ම අවශ්‍යතා සහ තත්වපාලන අවශ්‍යතා**

ඉගෙනුම් ඵලය
- ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් සඳහා ව්‍යවසාය අවදනම් කළමනකාරණය (ERM) ඒකාබද්ධ කිරීම පැහැදිලි කිරීම.
- මෙහෙයුම්, උපායමාර්ගික සහ පාලන රාමු තුළට ERM ඇතුලත් කර ගැනීමේ ප්‍රතිලාභ හඳුනා දැක්වීම.
- ආකෘතිමය රාමුව සහ ශිල්පීය ක්‍රම ඇතුලුව අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය පැහැදිලි කිරීම.
- අභ්‍යන්තර විගණනයක අවශ්‍යතාවය තක්සේරු කිරීමේදී සලකා බැලිය යුතු සාධක පැහැදිලි කිරීම.
- මූලික ආචාරධර්මවලට අනුකූල වීමේ තර්ජන හඳුනා දැක්වීම සහ හඳුනාගත් තර්ජනවල වැදගත්කම අගය කිරීම.
- තර්ජන පිළිගත් මට්ටමකට මුලිනුපුටා දැමීම / අඩු කිරීම සඳහා ආරක්ෂණ ක්‍රම භාවිතා කිරීම.

## (a) ව්‍යාපාර අවදානම් කළමනාකරණය (ERM) ඒකාබද්ධ කිරීම:

දෛනික ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමේදී අවදානම් කළමනාකරණය ඇතුළත් කිරීමෙන් ERM, **Med Care** හි ව්‍යාපාරයට ඒකාබද්ධ කළ හැකිය.

- **කාර්යක්ෂමතාව සහ අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතිය වැඩි කිරීම:** රෝගී සත්කාර, උපකරණ අසමත්වීම් හෝ සේවා ප්‍රමාදයන් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම. දෙපාර්තමේන්තු හරහා ERM යෙදීම පුනරාවර්තන හෝ නොගැලපෙන අවදානම් කළමනාකරණ පිළිවෙත් ඉවත් කිරීමට උපකාරී වේ. එය සමාගම පුරා අවදානම් දැනුවත් කිරීමේ සංස්කෘතියක් ගොඩනගන අතර, මෙහෙයුම් බිඳවැටීම වැළැක්වීමට උපකාරී වේ.

- **ශක්තිමත් නියාමන අනුකූලතාව සහ ආරක්ෂාව:** සෞඛ්‍ය සේවා රෙගුලාසි සහ බලපත්‍ර අවශ්‍යතා පිළිපැදීම නිරීක්ෂණය කිරීම. පුද්ගලික දත්ත ආරක්ෂණ නීති දැන් ක්‍රියාත්මක වන බැවින් ERM මගින් අනුකූලතා අවශ්‍යතාවයට වඩා ඉදිරියෙන් සිටීමට Med Care හට උපකාරී වේ. හොඳින් ඒකාබද්ධ වූ ERM පද්ධතියක් නීතිමය උල්ලංඝනයන් ඇතිවීමේ හැකියාව අඩු කරමින් දෙපාර්තමේන්තුව පුරා පෞද්ගලිකත්වය සහ නිතිපතා සමාලෝචනය කිරීම සහ කළමනාකරණය කිරීම සහතික කරයි.

- **වඩා හොඳ තීරණ ගැනීමේ සහාය:** නව රෝහල් විවෘත කිරීමේදී හෝ නව පද්ධතිවල ආයෝජනය කිරීමේදී අවදානම් සලකා බැලීම. ව්‍යුහගත ERM ප්‍රවේශයක් භාවිතා කිරීමෙන් සමාගමට සංවිධානය පුරා අවදානම් වඩාත් සඵලදායී ලෙස අවදානම් හඳුනාගෙන ඇගයීමට හැකිය. මෙය අභියෝග සහ අවස්ථා පැහැදිලිව තේරුම් ගැනීමෙන් නායකත්වයට වඩා දක්ෂ තෝරා ගැනීම් කිරීමේ හැකියාව ලබා දෙයි.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 06)**

## (b) ERM ඇතුළත් කිරීමේ ප්‍රතිලාභ:

- **මෙහෙයුම් ප්‍රතිලාභය:** සේවා බාධා කිරීම් අඩු කිරීමට, රෝගීන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීමට සහ කාර්ය මණ්ඩල හිඟය හෝ සැපයුම් දාම ගැටළු වැනි අවදානම් හඳුනා ගැනීමට උපකාරී වේ.

- **පාලන ප්‍රතිලාභය:** අධ්‍යක්ෂක මණ්ඩලයට සහ විගණන කමිටුවට අවදානම් පිළිබඳ වඩා හොඳ දෘශ්‍යතාවයක් ලබා දීම මගින් වඩාත් දැනුවත් තීරණ ගැනීම සහ අධීක්ෂණය සක්‍රිය කරයි.

- **උපායමාර්ගික ඉලක්ක සමඟ අවදානම පෙළගැස්වීම:** රෝහල් පුළුල් කිරීම හෝ නව තාක්ෂණයන් අනුගමනය කිරීම වැනි ප්‍රධාන උපායමාර්ගික මුලපිරීම් මගින් අවදානම් බලපෑමට යොමු කරමින් ඇගයීමට ලක් කරන බව සහතික කිරීමට ERM උපකාරී වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට යථාර්ථවාදී සහ තිරසාර සැලසුම් කිරීමට ඉඩ සැලසේ.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(c) අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය:**

අභ්‍යන්තර විගණන ක්‍රියාවලියට ඇතුළත් වන්නේ:

- **සැලසුම් කිරීම** - විගණන විෂය පථය සහ අරමුණු නිර්වචනය කිරීම, අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනා ගැනීම උදා: සායනික බිල්පත් හෝ ප්‍රසම්පාදනය, දත්ත ආරක්ෂාව.
- **ක්ෂේත්‍ර කටයුතු** - අභ්‍යන්තර පාලනයන් සඵලදායී ලෙස ක්‍රියාත්මක වේද යන්න තක්සේරු කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, පද්ධති ඔස්සේ යාම් සහ ලේඛන සමාලෝචන හරහා සාක්ෂි එකතු කිරීම.
- **වාර්තා කිරීම** - සොයාගැනීම් සාරාංශ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ නිර්දේශ කිරීම. දුර්වලතා සහ නිර්දේශිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීමෙන් වාර්තා මගින් විගණනයේ සොයාගැනීම් කළමනාකරණයට සහ විගණන කමිටුවට සන්නිවේදනය කිරීම.
- **පසු විපරම** - අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා නිර්දේශිත කාලරාමු තුළ ගැටළු නිවැරදි කිරීමට පියවර ගෙන තිබේද යන්න සමාලෝචනය කිරීම.

**(එකකට ලකුණු 01 බැගින් ලකුණු 04)**

**(d) අභ්‍යන්තර විගණන කාර්යයක් ස්ථාපිත කිරීම:**

- **සෞඛ්‍ය සේවා කර්මාන්තයේ සංකීර්ණත්වය: Med Care** හි කටයුතු පුළුල් වන විට, එහි මෙහෙයුම් වඩාත් සංකීර්ණ වනු ඇත. විශේෂයෙන් වෛද්‍ය සේවා ප්‍රසම්පාදනය වැනි ක්ෂේත්‍රවල. තවද රෝහල් නියාමනය කර ඇති බැවින්, දෝෂ (උදා: ප්‍රතිකාර හෝ බිල්පත් කිරීමේදී) බරපතල ප්‍රතිවිපාක ඇති කළ හැකිය. අභ්‍යන්තර විගණනයන් මගින් පාලනයන් ක්‍රියාත්මක වන බව සහතික කිරීමට උපකාරී වන අතර මෙම තීරණාත්මක ක්ෂේත්‍රවල විභව අවදානම් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දෙන බව සහතික කරයි.
- **පුළුල් කිරීම සහ විමධ්‍යගත කිරීම:** වැඩිපුර රෝහල් පිහිටුවීමට සැලසුම් කර ඇති විට, මෙහෙයුම් මධ්‍යගතව නිරීක්ෂණය කිරීම දුෂ්කර වේ. එබැවින් අභ්‍යන්තර විගණනය විවිධ ස්ථාන හරහා ස්වාධීන සහතිකයක් සපයයි.
- **නීතිමය සහ නියාමන අනුකූලතාව සහතික කිරීම:** සමාගම රහසිගත රෝගී තොරතුරු හසුරුවන බැවින් සහ අභ්‍යන්තර විගණන කණ්ඩායම **Med Care** නව දත්ත ආරක්ෂණ නීති සහ කර්මාන්ත රෙගුලාසි වල අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීමට උපකාරී වේ. මෙය දණ්ඩන, නීතිමය ගැටළු හෝ කීර්ති නාමයට හානි කිරීමේ සම්භාවිතාව අඩු කරනු ඇත.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(e) ආචාර ධර්ම වලට ඇතිවන තර්ජනඃ**

- **සුහදශීලී වීමේ තර්ජනයඃ** විගණන හවුල්කරු අඛණ්ඩව වසර හතක් **Med Care** විගණනයේ සේවය කර ඇති අතර ප්‍රධාන මූල්‍ය නිලධාරියාට (CFO) ට සමීප වී ඇත. මෙය විගණකගේ අරමුණුගතභාවය සහ ස්වාධීනත්වය, වෘත්තීය සංශය දෘෂ්ටියට හානි කළ හැකිය.

- **ස්වයං-ඇල්ම පිළිබඳ තර්ජනයඃ** විගණන කණ්ඩායම් සාමාජිකයෙකු විසින් සේවාලාභියාගේ මානව සම්පත් දෙපාර්තමේන්තුවෙන් තෑගි වවුචරයක් පිළිගෙන ඇති බැවින් ඔහු පක්ෂග්‍රාහී විය හැකි හෝ පක්ෂක්ග්‍රාහී බවක් පෙන්විය හැකිය, විශේෂයෙන් පෙළඹවීම ඔවුන්ගේ කාර්යයට බලපාන්නේ නම් පුද්ගලික ප්‍රතිලාභය විගණකගේ අරමුණුගතභාවයට බලපෑම් කළ හැකි අතර අපක්ෂපාතීව සිටීමට හෝ සේවාලාභියාගේ ක්‍රියාවන් සඵලදායී ලෙස ප්‍රශ්න කිරීමට ඇති හැකියාව අඩු කළ හැකි බැවින් මෙය ස්වයංඇල්ම පිළිබඳ තර්ජනයක් ඇති කරයි.

**(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 04)**

**(f) ආරක්ෂණ පියවරඃ**

- **කාර්යභාර හවුල්කරු මාරු කිරීමඃ** සුහදශීලීබව අඩු කිරීමට සහ විගණනයට නැවුම් දර්ශනයක් ගෙන ඒමට කාර්යභාර හවුල්කරු මාරු කිරීම.

- **විගණන සමාගම පුරා තෑගි ප්‍රතිපත්තිය සහ විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමඃ** සියලුම කණ්ඩායම් සාමාජිකයින් වෘත්තීය ගණකාධිකාරීවරුන්ගේ ආචාර ධර්ම සංග්‍රහය තේරුම් ගෙන පිළිපැදීම සහතික කිරීම සඳහා වෘත්තීය ආචාර ධර්ම පිළිබඳ පුහුණුවක් ලබා දීම. එවැනි තෑගි පිළිගැනීමේදී නාමික වටිනාකම් සීමාවක් නියම කිරීමද ඇතුලත්ව තෑගි පිළිගැනීම සම්බන්ධයෙන් පැහැදිලි දැඩි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

**(එකකට ලකුණු 01½ බැගින්, ලකුණු 03)**

**(මුළු ලකුණු 25)**

**C කොටසෙහි අවසානය**